අපහසුතා ආදිය ගැන කිසි අවබෝධයකින් යුතුව මෙසේ චෝදනාත්මකව මෙන්ම ආයාචනාත්මකව ද කළ ඉල්ලීම් සැබවින්ම පාර්ලිමේන්තුව තුළ නැගුණ ප්‍රබලතම හඬක් ලෙස එදා සැලකුණ බවට සැකයක් නැත. රුව ඇති දුවක් මෙන්ම ඊටත් වඩා කට ඇති දියණියක් ලෙසට, කට ඇති පුතුන් විශාල සංඛ්‍යාවක් ඉදිරියේ මෙලෙසට හඬ නැගීම ඇය සතු විශේෂ දක්ෂතාවක් මෙන්ම කැපවීමක් ද පෙන්නුම් කරයි.

කුසුමා ගුණවර්ධන මැතිනිය සිය පියා ඇතුළු පවුලේ ඇත්තන්ගේ ඇසුරේ හැදෙමින්, වැඩෙමින් සිය දැනුම ද විවිධාංශවලින් පුළුල් කරගෙන තිබීම පාර්ලිමේන්තු විවාදවලදී ඇයට මහඟු ආශීර්වාදයක් විය. "ගම්මුලාදෑනීන් තෝරන ක්‍රමය මුළුමනින්ම වාගේ අසතුටුදායකය. අද ගම්මුලාදෑනීන් තෝරා පත් කරන්නේ, පරණි රටේ මහත්තැන්, මුදලිවරුන්, මුහන්දිරම්වරුන්, කොරියාස මුලාදෑනීන් ආදීන් පත් කරන ලද අන්දමටය." (66 පිට) මෙබඳු විවේචනයක් කරන්නට නම් පැරණි ශ්‍රී ලංකාව තුළ උක්ත කරුණ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ ආකාරය හොඳින් දැන සිටිය යුතු විය. එබඳු පසුබිම් දැනීමකින් යුතුව මෙතුමිය සන්සන්දනාත්මක ලෙස කරුණු ගෙන හැර දක්වමින්, විවිධ තර්ක ඉදිරිපත් කරමින් චතුර කථිකත්වයෙන් යුතුව පාර්ලිමේන්තු විවාද ඔස්සේ පෑ දක්ෂතාව වර්තමානයේ කාන්තා දේශපාලනඥයින් සතුව ද ඇත්නම් කොතරම් අගනේද!

දොළොස්වසරක් පුරා ඇය එක ලෙසටම පාර්ලිමේන්තුව තුළදී පෑ දක්ෂ කථිකත්වය මෙන්ම ඉදිරිපත් කළ අදහස්වල තර්කානුකූල හා සාධාරණ බව ද මෙම ග්‍රන්ථය කියවන්නකුට පහසුවෙන්ම වටහාගත හැකිය. ජනතාව කෙරෙහි සැබෑ ආදරයක් හා අනුකම්පාවක් ඇය තුළ තිබූ බව ප්‍රකට වන, අර්ථවත් අදහස් රැසක් එතුමිය මෙම කාල සීමාව තුළදී පාර්ලිමේන්තු සභා ගර්භය තුළදී මුදා හැර ඇත. "බතට පුරුදු වූ කම්කරු ජනයාට හා ගොවීන්ට ඔවුන්ගේ පුරුදු බතට වඩා සුදුසු ආහාරයක් නැති බව කියනු කැමැත්තෙමි. ඔවුන්ටත් අර කෑම ජාතිම කෑමට සෑහෙන ආදායමක් ලැබෙන වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව සලසා දෙන්නේ නම් ඇමතිවරුන්ගේ මේ අවවාද පිළිපදින්න කම්කරු ජනතාව සහ ගොවි ජනතාවත් ලැහැස්ති වනවා ඇත." (75 පිට) විපක්ෂයක සිටිමින් හුදෙක් ආණ්ඩු පක්ෂය කරන සෑම දෙයක්ම දැඩි විවේචනයට ලක් කිරීම විනා වඩා සුදුසු දේ යෝජනා කිරීමක් වර්තමානයේ පවා දක්නට ලැබෙන්නේ කලාතු-රකිනි. එවැනි තත්වයක් සමග සැසඳීමේදී කුසුමා ගුණවර්ධන මැතිනිය සිය දේශපාලන කාර්යයේදී හුදෙක් වැරදි සෙවීම පමණක් නොව යහපත් යයි තමන්ට සිතෙන විකල්ප යෝජනා ඉදිරිපත් කිරීමෙන් සාධනීය ආකල්පයක් හෙළි කොට තිබීම ද අගය කළ යුත්තකි.

මෙතුමිය විවාද සඳහා භාවිත කළ සිංහල භාෂාව සැබවින්ම වාසාතුල බවෙන් තොර, පැහැදිලි වචනවලින් සමන්විත, අර්ථය තිරවුල් ලෙස ඉදිරිපත් වන භාෂා විලාසයක් බව ද විශේෂ කරුණකි. ".... මෙවැනි නිතුවක්කාර කම්වලට විරුද්ධව නැගී නොසිටින නිවටයන් අද ලංකාවේ නැති බව මම තමුන්නාන්සේට කියනු කැමැත්තෙමි. මහජන හඬට කන් නොදී වැඩ කිරීමට..... අදහස් කරනවා නම්, නුදුරු අනාගතයේදී ලංකාවේ මහජනයා විසින්, පසුගිය කාලයෙහි තම අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට පෑතුගිසි, ඕලන්දක්කාර, ඉංග්‍රීසි ආදී ජාතීන් සටන් කළා මෙන්ම, මේ කළු ධනපතීන්ට විරුද්ධව ද සටන් කර ..... ඒ සාධාරණ සටනින් මහජනයා කවර දා නමුත් ජය ගන්නා බව මතක් කරමින් මගේ කතාව අවසන් කරමි." (107 පිට)

පොදුවේ ගෙන බලන විට රටක පාලනය ශක්තිමත් වීමට මෙන්ම අඩුපාඩු හා දුර්වලතා අවම කරගැනීමට නම් මෙවැනි අවධානයකින් යුතුව කරුණු පෙන්වා දීම, ප්‍රශ්න මතු කරමින් සාධනීය විවේචනයන්හි යෙදීම යනාදිය විරුද්ධ පක්ෂයෙන් හෝ පක්ෂවලින් සිදු විය යුතුය. කුසුමා ගුණවර්ධන මැතිනිය සිය දක්ෂතා, දැනුම, බුද්ධිය මෙන්ම සැබෑ ලෙසම මහජනතාව වෙත දක්වන දයාව හා කරුණාව ද සමග, දේශපාලනයෙහි නිරතව සිටි ක්‍රියාශීලි කාන්තාවක ලෙස දැක්වූ උනන්දුව මෙම කෘතිය පුරාම පළ වී ඇති හැන්සාඩ් වාර්තා මගින් ඉස්මතු වී පෙනෙයි. ශ්‍රී ලංකා මාතාව සිය දියණියන් අතරට මෙවන් දක්ෂ, කැපවීමෙන් යුතුව කටයුතු කරමින් සිය ජීවිත කාලය තුළ රටට මෙහෙවරක් කළ හැකි විශේෂ කාන්තාවක් බිහි කර තිබීම කාන්තාවන් වශයෙන් අප හැමගේ සතුටට හා ආඩම්බරයට හේතු වනු ඇත.


MONT ALBERT DENTISTS P/L

For all Your Dental Requirements

We Provide

GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES

WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.

FOR APPOINTMENTS
9890 3609

DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS

DR. ENOKA JAYATILAKEBANDA (BDS)

MONT ALBERT DENTISTS

2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)

www.montalbertdentists.com.au



IMMIGRATION LAW @
Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

Professional Immigration Legal Services
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents

Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com

We Deliver Results...